# මෛථුනධම්ම පාරාජික ආපත්තිය, සදාචාර දර්ශනය හා බෞද්ධ පරමනිෂ්ඨාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

# An Investigative Study on Defeat from Sexual Intercourse, Moral philosophy and Buddhist Summum Bonum

**දාපනේ චන්දරතන හිමි**

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණයෙදී මෛථුනධම්ම පාරාජික ආපත්තිය පිළිබඳ අර්ථවිවරණය කිරීම, අනුපඤ්ඤත්ති සහ ඒ හා බැඳුණු සවිස්තරාත්මක පැණවීම් පිළිබඳ කෙටියෙන් දැක්වීම, සදාචාර දර්ශනය හා බෞද්ධ පරම නිෂ්ඨාව යන කාරණා සාකච්ඡා කෙරේ. පාඨකයාට පහසුවෙන් අවබෝධ කරගැනීමට හැකි වන පරිදි මෛථුනධම්ම පාරාජික ආපත්තිය හා බැඳුණු පෙළෙහි හා අටුවාවෙහි විස්තර හැකිතාක් දුරට මෙහි කෙටියෙන් දක්වා ඇත. තවද පාරාජික ආපත්තියේ අන්තර්ගත සියලු පැනවීම් බුද්ධභාෂිතයක් ද යන්න විමර්ශනය කිරීම සහ ඇතැම් පැනවීම් අතිශෝක්තියෙන් යුක්ත වේ ද යන්න ද වීමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙදී සිදු වේ. අවසාන වශයෙන් පාරාජිකා ආපත්තිවල අන්තර්ගත සදාචාරාත්මක ලක්ෂණ කෙටියෙන් විශ්ලේෂණය කිරීමත් එම සදාචාරාත්මක මාර්ගය බුදුදහමේ පරම නිෂ්ඨාව වන නිර්වාණ අවබෝධය සඳහා ඉවහල් වන ආකාරයත් මෙහිදී සාකච්ඡා කෙරේ.

**යතුරු පදඃ** පාරාජික, මෛථුනධම්ම, සදාචාර දර්ශනය, පරම නිෂ්ඨාව

## Abstract

In the research it annotates the first defeat (*pārājika*), the sexual intercourse and briefly bespeaks

extra-enforcements related to the first defeat (*pārājika*) and also it discusses Buddhist moral philosophy and Summum Bonum depicted in the first defeat (*pārājika*). It includes in the research, the descriptions contained in Canon and commentary very briefly for the better understanding of the reader. Furthermore it investigates whether whole contain of the first defeat is preached by the Buddha or later Resensionists and whether the description of the first defeat is over descriptive or not. Finally, it discusses the moral features of the first defeat and its influence for the attainment of *Nibbāna*.

**Keywords:** Defeat (*pārājika*), Intercourse, Ethics, Summum Bonum

**හැඳින්වීම**

උපසපන් භික්ෂුවක් අතින් සිදුවිය හැකි බරපතල වැරදි පාරාජිකා නම් වේ. පාරාජිකපාළියේ සඳහන් පරිදි යම්කිසි භික්ෂුවක් පාරාජික ආපත්තියකට ලක් වුවහොත් එම භික්ෂුවගේ උපසපන් භික්ෂුභාවය අහිමි වේ. මෙම පර්යේෂණයේදී භික්ෂූන් වහන්සේලා සඳහා ඇති මෛථුනධම්ම පාරාජික ආපත්තිය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් සිදුකිරීමත්, එම ශික්ෂා පදය පැනවීමේ අරමුණු සහ එහි ස්වභාවය අධ්‍යයනය කිරීමත්, ආචාර විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් මෛථුනධම්ම පාරාජික ආපත්තිය විමසා බැලීම සහ බෞද්ධ දර්ශනයේ පරමනිෂ්ඨාව සඳහා මෛථුනධම්ම පාරාජික ආපත්තියෙන් වැළකී සිටිම කෙසේ ඉවහල් වන්නේද යන්න අධ්‍යයනය කිරීමත් ප්‍රධාන අරමුණු වේ.

මෛථුනධම්ම පාරාජික ආපත්තියේ සමස්ත පැනවීම් සහ විග්‍රහය දෙස විමසිල්ලෙන් පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන්නේ එහි ප්‍රධාන විනය නීතිය වඩාත් තහවුරු කිරීම සඳහා සංකීර්ණව විශ්ලේෂණය කොට ඇති බවයි. එසේම ඇතැම් කරුණු පසුකාලීනව සිදුකොට ඇති විස්තර බව ද පැහැදිලිය. එබැවින් පාරාජිකපාළියේ

අන්තර්ගත සංකීර්ණ විස්තර බුද්ධභාෂිතයක් නොවේද? එසේම පාරජික ආපත්තියෙන් වැළකී සිටීම සදාචාරාත්මක ලක්ෂණයක්ද, තවද එම සදාචාරවත් බව බුදුදහමේ පරම නිෂ්ඨාව සඳහා ඉවහල් වන්නේද යන ඒවා පර්යේෂණ ගැටලු වේ. මෛථුනධම්ම පාරාජික ආපත්තිය පිළිබඳ කරුණු අධ්‍යයනයෙදී මේදී සංක්ෂිප්තව එම පාරාජික ආපත්තිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට මෙම පර්යේෂණය වැදගත් වේ.

**සාහිත්‍ය විමර්ශනය**

මෛථුනධම්ම පාරාජික ආපත්තිය පිළිබඳ විනය පිටකයේ පාරාජිකපාළියෙත් (ධම්මකුසල, අම්බලන්ගොඩ. (1999). (සංස්). සමන්තපාසාදිකා විනයට්ඨකතා, පාරාජිකකාණ්ඩය, (සිංහල පරිවර්තනය), පළමු කොටස, ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය සහ වේරගොඩ අමරමෝලි ස්ථවිරයන් වහන්සේ. (2005). (පරි.) විනයපිටකයෙහි 01 වන ග්‍රන්ථය, පාරාජිකපාළි, බු.ජ.මු.) සමන්තපාසාදිකාවෙත් (කෙසෙල්වතුගොඩ ශ්‍රී රතනජෝති ස්ථවිරයන් වහන්සේ. (2006). (පරි.) විනයපිටකයෙහි 05 වන ග්‍රන්ථය, පරිවාරපාළි, බු.ජ.මු. ) විස්තරාත්මකව කරුණු අන්තර්ගත වේ. එසේම ''Horner, I.B. (1949). (tr.). The Book of the Discipline (Vinaya-Piṭaka) Vol. I (Suttavibhaṅga), Pali Text Society, London'' යන විනය පිටකයේ ඉංග්‍රීසි පරිවර්තනයේ හැඳින්වීම කොටසේ මෛථුනධම්ම පාරාජික ආපත්තිය පිළිබඳ පැනවීම් බුද්ධ භාෂිතයක්ද යන්න පිළිබඳ කරුණු අන්තර්ගත වේ. මෛථුනධම්ම පාරාජික ආපත්තිය පිළිබඳ විවිධ පර්යේෂකයින් විසින් කරුණු අධ්‍යයනය කොට ඇතත් එම පාරාජික ආපත්තියේ සදාචාර දර්ශනය හා එම සදාචාර දර්ශනය බුදුදහමේ පරමනිෂ්ඨාවට ඉවහල් වන ආකාරය පිළිබඳ අධ්‍යයන කොට ඇති අධ්‍යයනයන් අල්ප වේ. එබැවින් මෙම පර්යේෂණයෙන් එම යථොක්ත කරුණු අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

පුස්තකාලය හා අන්තරජාලය මගින් යථොක්ත ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයන කරමින් සංසන්දනාත්මක හා විශ්ලේශි අධ්‍යයන ක්‍රමවේද යටතේ මෙම පර්යේෂණය සිදු කෙරේ.

**සාකච්ඡාව**

පාරාජිකා යන වචනයට විවිධ ශබ්දකෝෂවල නිරුත්ති සහ අර්ථ සපයා ඇත. රීස් ඩේවිඩ්ස් සහ විලියම් ස්ටේඩ් විසින් පාරාජික යන වචනයෙහි නිරුක්තිය (බෘනොගේ නිරුක්තිය?) පිළිබඳ සැක පහළ කරයි, එමෙන්ම ඔවහු පරා+අජ් (බෘනො) යන නිරුත්ති මෙන්ම පර+ජි; පාරාචික යන ලෙස පද විග්‍රහ යෝජනා කරනු ලැබෙති. තවද පරාජික යන වචනය නිර්වචනය කොට ඇත්තේ භික්ෂූන් සඳහා ඇති නීතියේ බරපතල උල්ලංඝනයක් සිදුකොට ඇති තැනැත්තා; පිං (කුසල්) අපහරණය කළ තැනැත්තා යනුවෙනි (1921-1925: 505). R.C. Childers වනාහි 'පාරාජිකො' යන වචනය පිං (කුසල්) අපහරණය කිරීම ලෙස දක්වයි. තවද බෘනො දක්වා ඇති 'පරා+අජ්' යන නිරුත්තිය නිසැක බව උපුටා දක්වමින් පාරාජික යන වචනය සැකසී ඇති බව සඳහන් කරයි. එමෙන්ම 'පාරාජික ධම්ම' යන්න නිර්වචන කොට ඇත්තේ පැවිදිභාවයෙන් (priesthood) ඉවත්වීම සඳහා හේතු වන පාපා යනුවෙනි. එසේම විනය ලයිස්තුවේ ඉහතින්ම දක්වා ඇති පැවිදි ඇවැත්වල බරපතල විනය නීති ලෙස ද දක්වා ඇත (1976:333). පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් විසින් රචිත පාලි ශබ්දකෝෂයේ ද P.T. ශබ්දකෝෂයේ පාරාජික යන්න දක්වා ඇති අර්ථයම සඳහන් වේ (බලන්නඃ.1958:199). අයි. බී. හෝනර් මෙනෙවිය පාරාජික යන වචනය පරාජය (defeat) යනුවෙන් පරිවර්තය කොට ඇත. තව ද විනය නීති අතර වඩා බරපතල ආපත්ති ලෙස මෙන්ම සංඝයාගෙන් නෙරපීමට හේතු වන වැරදි ලෙස ද දක්වා ඇත (1949ඃ xx). මෙම නිරුත්ති සහ නිර්වචනවලින් පැහැදිලි වන්නේ පාරාජික ආපත්ති විනය නීතිවල අන්තර්ගත වඩාත් බරපතල ආපත්ති බවයි. මෙම කරුණු වඩාත් තහවුරු කරගැනීම සඳහා පෙළෙහි සහ අටුවාවල අන්තර්ගත විවරණ විමසා බැලීම වැදගත්වේ. සමන්තපාසාදිකාවේ; ''පාරාජිකො'පරදවන ලද්දේය. පරාජයට පැමිණියේය.'' යනුවෙන් සඳහන් වේ. එමෙන්ම විනය සන්දර්භය තුළ පාරාජික යන ශබ්දය ශික්ෂාපද, ආපත්ති සහ පුද්ගල යන තන්හි යෙදෙන බව සඳහන් කෙරේ. මෙහිදි යමෙක් ශික්ෂාපදය ඉක්මවයිද ඒ ඉක්මවන ලද පුද්ගලයා පරදීද එබැවින්

පාරාජිකයි කියනු ලබේව් යනුවෙන් අටුවාවෙහි පාරාජික පිළිබඳ වැඩි දුරටත් විස්තර කරයි. පාරාජිකපාළිය සඳහන් කරන ආකාරයට 'පාරාජිකො හොති' යනු ''යම් සේ හිස සිදුණු පුරුෂයා එම ශරීර බන්ධනයෙන් ජීවත්වන්නට සුදුසු නොවන්නේද එසේම (මෛථුන) පාරාජික ආපත්තියට පැමිණි මහණ තෙමගේ ශ්‍රමණ භාවය අහෝසි වේ. අශාක්‍යපුත්‍රයෙක් වේ. එබැවින් පැරදුනෙක් වේ'' (2005: 69) යනුවෙනි. එමෙන්ම පරිවාරපාළියේ පාරාජික යන්න අර්ථ දක්වා ඇත්තේ ''පාරාජිකයි යමක් කියනලදද එය තතු ලෙසින් අසව. සාසනයෙන් චුතවූයේද, පැරදුණේද, ගිලිහුණේද, බැහැර කරන ලද්දේද, ඔහු කෙරෙහි උපෝසථ පවාරණාදි ප්‍රභේදවත් වූ සංවාසය නැත්තේද, ඒහෙයින් මෙම ශික්ෂාපදය පාරාජික නම් වන්නේය'' (2006: 102) ලෙසය.

ඉහත පෙළෙහි සහ අටුවාවෙහි දක්වා ඇති විවරණ අනුව පැහැදිලි වන්නේ පාරාජික යන වචනය භාවිත කොට ඇත්තේ මහණ තෙම භෞතික වශයෙන් සිදුකරගන්නා වූ පරාජයක් නොවේ. එනම්, භික්ෂුව ආධ්‍යාත්මික වශයෙන් සිදු කරගන්නා වූ පරාජයකි. එබැවින් මෙහි පාරාජික (පැරදීම) යනු සම්මුති ව්‍යාවහාරයේ සාමාන්‍ය වශයෙන් යෙදෙන පරාද වීම යන අර්ථය නොවන බව අවබෝධ කරගත යුතුය. තවද මෙහි පරාද වීම යනු බුදුදහමේ පරම නිෂ්ඨාව කරා යන ආධ්‍යාත්මික ගමනේ යා නොහැකිව සිදුකර ගන්නා වූ පරාජයකි. භික්ෂුවක් නොවන සාමාන්‍ය මනුෂ්‍යයෙකු මෛථුන සේවනයේ යෙදීමෙන් මෙවැනි පරාජයක් සිදු නොවේ. මන්දයත් මෛථුන සේවනය යනු ජීවවිද්‍යාත්මක අවශ්‍යතාවක් නිසාවෙනි. මෙය ගරුක ආපත්තියක් වන්නේ භික්ෂුවකට පමණි. එබැවින් පාරාජික යන වචනය විනයෙහි භාවිත කොට ඇත්තේ ආචාර විද්‍යාත්මක සන්දර්භයක් තුළය; එනම් බුදුදහමෙහි පරමනිෂ්ඨාව කරා ළඟාවීමේදී භික්ෂුවකට බරපතල ලෙස බාධා පමුණුවන න-සදාචාර ක්‍රියා පාරාජික ආපත්ති යනුවෙන් දක්වා ඇත.

මෙහිදී මෛථුනධම්ම පාරාජික පිළිබඳ අධ්‍යයනය කරන බැවින් මෛථුනධම්ම යන වචනාර්ථය පැහැදිලි කරගත යුතුය. පළමුව ඒ පිළිබඳ පෙළෙහි හා අටුවාවෙහි දක්වා ඇති

අර්ථකථන සියුම්ව පරීක්‍ෂා කිරීම වැදගත් වේ. පාරාජිකපාළියෙහි 'මෙථුනොධම්මො' නම්: ''යම් ඒ නීච ජනයාගේ ස්වභාවයක් වේද (අසද්ධම්මො), ගම්වැස්සන්ගේ ස්වභාව ධර්මයෙක් වේද (ගාමධම්මො), වසලයන්ගේ ගතියක් වේද (වසලධම්මො), කෙලෙසුන්ගෙන් දූෂිත බවක් වේද (දුට්ඨුල්ලං), දියකිස අවසන් කොට ඇත්තක් වේද (ඔදකන්තිකං), රහසින් කටයුතු දෙයක් වේද (රහස්සං), දෙදෙනෙකුන් දෙදෙනෙකුන් විසින් සමවැදිය යුත්තක් වේද (ද්වයංද්වයසමාපත්ති) මේ (මෙථුනධම්ම) නම් වේ (2005:67).'' මෙම පද විවරණ තුළින් මෙථුනධම්ම යනු ලිංගික සංසර්ගය බව ඍජුව නොදක්වයි. එයට ඍජු අර්ථයක් ලැබෙන්නේ ඉන්පසුව යෙදෙන පතිසෙවති: එනම් යමෙක් තෙමේ නිමිත්තෙන් නිමිත්ත අංගජාතයෙන් අංගජාතය යටත් පිරිසෙයින් තල ඇටක් පමණකුදු පිවිස්වාද (එම) යන පද විග්‍රහයෙනි.

සමන්තපාසාදිකාව අසද්ධම්මො යන්න නොසන්සිඳුණු ලාමක ජනයාගේ ධර්මය (අසතං නීචජනානං ධම්මො) යනුවෙන්ද, ගාමධම්මො යන්න ගම්වැසියන් විසින් සෙවුනා ලද ධර්මය (ගාමවාසීනං සෙවනධම්මො) යනුවෙන්ද, වසලධම්මො යන්න සැඩොලුන්ගේ ස්වභාවයයි; කෙලෙස් වස්වන බැවින් හෝ තෙමේම වසල වූ ධර්මනුයි වසල ධම්ම නම් වේ (වසලානං ධම්මො; කිලෙසවස්සනතො වා සයමෙව වසලො ධම්මොති වසල ධම්මො) යනුවෙන් ද, දුට්ඨුල්ලං යන්න අහිරික ආදී වූ කෙලෙසුන් විසින් දූෂිතකළ බැවින් පුළුල් වූයේද සියුම් නොවන බැවින් දළ වූයේද දුට්ඨුල්ල නම් (දුට්ඨුඤ්ච කිලෙසෙහි දුට්ඨත්තා, ථූලංච අනිපුණභාවතොති දුට්ඨුල්ලං) යනුවෙන්ද, මෙථුනධම්ම ප්‍රතිසේවන ක්‍රියාවෙහි අවසානයෙහි පිරිසිදු කිරීම පිණිස දියගැනීම වේද එය ඔදකන්තිකං (උදකං අස්ස අන්තෙ සුද්ධත්ථං ආදියන්තීති උදකන්තං) යනුවෙන්ද, රහස්හි පිළිසන් අවකාශයෙහි කළයුතු බැවින් රහස්සං (රහො පටිච්ඡන්නෙ ඔකාසෙ කත්තබ්බතාය රහස්සං) යනුවෙන්ද, දෙදෙනෙකු (ස්ත්‍රී පුරුෂ) විසින් සමවැදිය යුතු බැවින් ද්වයංද්වයසමාපත්ති (ද්වයෙන ද්වයෙන සමාපජ්ජිතබ්බතො ද්වයංද්වයසමාපත්තීති) යනුවෙන් ද මෙථුනධම්ම යන පදයට අර්ථවිවරණ සපයා ඇත (1999:246).

ඉහත පාරාජිකපාළියේ පදභාජනීය කොටසෙහි සහ සමන්තපාසාදිකාවේ මෙථුනධම්ම යන පදයට අර්ථවිවරණ සපයා ඇත්තේ ලිංගික සංසර්ගය යන ඍජු අර්ථය ප්‍රකාශ වන පරිදි නො වේ; එනම් ලාමක, ග්‍රාම්‍ය සහ වසල වැනි පහත් යැයි සම්මත ජනයා විසින් සිදු කරන ක්‍රියාවක් ලෙසය. මෙහිදී මෙථුනධම්ම යනු පෘථුජ්ජන සියලු සත්ත්වයන්ට පොදු වූ ධර්මතාවක් ලෙස අර්ථ දැක්වීමට වඩා පහත් යැයි සම්මත ජනයා විසින් සිදුකරන කෙලෙස් වර්ධනය වන සදාචාර විරෝධි ක්‍රියාවක් ලෙස අර්ථ දැක්වීම සිදු කොට ඇත. එසේම එය (මෙථුන) සිදු කිරිමෙන් පසු ජලයෙන් පිරිසිදු කරගැනීම, රහසේ සිදුකිරීම, දෙදෙනෙකු විසින් සිදු කිරීම වැනි වැනි අතුරු ක්‍රියාවන්ද මෙථුනධම්ම යන්න අර්ථ දැක්වීම සඳහා යොදාගෙන ඇත. බැලූබැල්මට ලිංගික සංසර්ගය නිග්‍රහාත්මක පහත් ක්‍රියාවක් යැයි පෙනෙන මෙම අර්ථකථනවල පසුබිම සියුම් ව පරීක්ෂාකර බැලිය යුතුය.

මේ සඳහා පළමුව මෙථුන යන වචනයේ අර්ථය තවදුරටත් විමසා බැලිය යුතුය. මෙථුන යන පාලි වචනය සංස්කෘත භාෂාවේ මෛථුන යන පදයෙන් නිපන් වචනයකි. මෝනියං විලියම්ස්ගේ සංස්කෘත-ඉංග්‍රීසි ශබ්දකෝෂයේ මෛථුන යන පදය යුගල (paired), පූට්ටුව (coupled) යනුවෙන් මෙන්ම යුගලයක් සකස් කිරීම හෝ එකිනෙකාගෙන් එකෙකුගේ ලිංගිකත්වය (forming a pair or one of each sex) තවද මෛථුනධර්ම යන්න ලිංගික ධර්මය (නියමය); සංසර්ගය (sexual law; copulation) යනුවෙන් පරිවර්තනය කරයි (1986:835). ජේම්ස් ප්‍රනාන්දුගේ සංස්කෘත-සිංහල ශබ්දකෝෂය මෛථුන පදය මෙවුන්දම සහ සඟමය (1922:163) යනුවෙන් පරිවර්තනය කරයි. මලලසේකර ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂයෙa Sexual Intercourse යන්න පරිවර්තනය කොට ඇත්තේ මෛථුනය, ලිංගික සංසර්ගය (2004:921) යනුවෙනි. R.C. Childes ''මෙථුනො ධම්මො'' යන්න ''ලිංගික සංසර්ගය (sexual intercourse)'' (1976:246) යනුවෙන් නිර්වචනය කරයි. පාලි-ඉංග්‍රීසි ශබ්දකෝෂයේද මෙථුන යන පදය ලිංගික සංසර්ගය හා සම්බන්ද (relating to sexual intercourse) :1921-1925ථ 601) යනුවෙන් පරිවර්තනය කොට ඇත. පොල්වත්තේ බුද්ධදත්ත

හිමියන්ගේ පාලි-ඉංග්‍රීසි ශබ්දකෝෂයේ මෙථුන යන්න ලිංගික සංසර්ගය ලෙසත් මෙථුනධම්ම යන්න ඉහත අර්ථය හා සමාන වේ (same as the above) (1958: 228) යනුවෙන් ද දක්වා ඇත.

යථෝක්ථ නිරුක්ති හා පරිවර්තන පිරික්සීමෙන් පැහැදිලි වන්නේ මෙථුනධම්ම යන පදයෙහි ඍජු අර්ථය ලිංගික සංසර්ගය යන්නයි. එහෙත් පාරාජිකපාළියේ එවැනි ඍජු අර්ථයක් නොදක්වා මෙථුනධම්ම යන්න නිග්‍රහාත්මක වචනමාලාවකින් අර්ථ දක්වා ඇත්තේ එක් පැත්තකින් එම විනය නීතිය පැනවීමට පසුබිම් වූ සිද්ධීන් සලකාගෙනය; එනම් බ්‍රහ්මචාරි ජීවිතයක් ගතකිරීමට පැවිදි බිමට පත් භික්ෂුවක් අතින් එවැනි වරදක් සිදුවීම නිග්‍රහයට ලක්වියුතු කාරණයක් බව සලකා ඇත. මන්දයත් බුද්ධකාලීන භාරතීය බොහෝ ශ්‍රමණ සම්ප්‍රදායවල බ්‍රහ්මචාරී වීම පොදු ලක්‍ෂණයකි; බෞද්ධ භික්‍ෂුවටද එය පොදුවිය. එකල ගිහිපිරිස් බුදුසසුනට ඇතුළත් වූයේ ඒ බව නොදැන නොවේ. බුද්ධත්ත්වයෙන් මුල් විසිවස තුළ බ්‍රහ්මචාරි වීම නීතියක් ලෙස සංඝ සමාජය තුළ පනවා නොතිබුණි. බුදුන් වහන්සේ විනය නීති පැනවිමට එතරම් කැමැත්තක් නොතිබුණු බව පාරාජිකපාළියේ වේරඤ්ජා කාණ්ඩයේ බුදුන් වහන්සේ සහ සැරියුත් හිමියන් අතර වූ සංවාදයෙන් පැහැදිලිවේ. බුදුන්වහන්සේ අපේක්‍ෂා කරන ලද්දේ භික්‍ෂුව නීති රාමුවකට ගොනු කිරීම නොව ඔහු තුළ ස්වයං ශික්‍ෂිත බවක් ඇති කිරීමයි. මෙවන් පසුබිමක් තුළ භික්‍ෂුව ශ්‍රමණ සම්ප්‍රදායටම පොදු වූ මෙන්ම එහි ඉහළින්ම රැකිය යුතු සදාචාරාත්මක චර්යාවකට ප්‍රතිවිරුද්ධ හැසිරීම නිග්‍රහයට ලක්විය යුතු කාරණයක් ලෙස සලකා එය ග්‍රාම්‍ය වූ පහත් ජනයා විසින් සිදු කරන ක්‍රියාවක් ලෙස දක්වා ඇත. මෙහිදී ක්‍රියාව සිදු කළ පුද්ගයාට නිග්‍රහ කළා විනා ක්‍රියාව නිග්‍රහයට ලක් කොට නොමැත. එනම් මෛථුනයේ හැසීරිම නිග්‍රහයට ලක්වන කාරණයක් නොවේ. බුදුදහමට අනුව එය වැරදි ක්‍රියාවක් වන්නේ කාමයෙහි වරදවා හැසීරිමෙන් පමණි. එහෙත් මෙහිදී ක්‍රියාව සිදු කොට ඇත්තේ සාමාන්‍ය පුද්ගයෙක් නොව භික්‍ෂුවකි. තවද මෛථුන ක්‍රියාවෙහි යෙදීම කෙලෙස් පූර්ණයට හේතුවන බව යථොක්ත පාරාජිකපාළියේ පැහැදිලිව දක්වා ඇත. මෙලෙස සලකා බැලීමේදි පැහැදිලි වන්නේ මෙථුනධම්ම යන

පදය නිග්‍රහාත්මක වචනමාලාවකින් අර්ථදක්වා ඇත්තේ නීතිය පැනවීමට වඩා යථෝක්ත සදාචාරාත්මක පසුබිම සැලකිල්ලට ගෙනැයි අනුමාන කළ හැක.

මෛථුනධම්ම පාරාජික ආපත්තියෙන් පිළිබිඹු වන සදාචාර දර්ශනය හා බෞද්ධ පරමනිෂ්ඨාව සඳහා එහි අදාළත්වය විමර්ශනය කිරීමෙදී මෛථුනධම්ම පාරාජික පැනවීම සහ එයට සම්බන්ධව පාරාජිකපාළියේ දක්වා ඇති අනෙකුත් විස්තර විභාග සහ අනුපඤ්ඤත්ති පිළිබඳව අධ්‍යයනය කළයුතුය. ප්‍රථම පාරාජික ආපත්තිය පැනවීමට හේතු වූ සුදින්න තෙරුන්ට බුදුන් වහන්සේ අවවාද කරනු ලබන්නේ බෞද්ධ දර්ශනයේ පරමනිෂ්ඨාව වන නිර්වාණයට කෙතරම් එම ක්‍රියාව පටහැනි වන්නේද යන්නයි. එහිදී බුදුන් වහන්යේ තම දහම විරාගය, විසංයෝගය, අනුපදානය, නිරොධය සහ නිර්වාණය පිණිස දෙසන ලද දහමක් බව පෙන්වා දෙයි. එවැනි දහමක් සහ නිෂ්ඨාවක් පවතින ශාසනයක පැවිදිව එම දහමේ හරයට පටහැනිව ක්‍රියාකිරීම අනුවණ පුද්ගල (මොඝපුරිස) ක්‍රියාවක් බව හැඟවීමට සුදින්න තෙරුන්ගේ එම ක්‍රියාව නිග්‍රහයට ලක්කරයි. භික්ෂුව කාන්තාවක් සමග ලිංගික සංසර්ගයේ යෙදීමට වඩා සර්පයෙකුගේ මුඛයේ හෝ ගිනිඅඟුරුවලක තම අංගජාතකය බහාලන්නේ නම් වඩා මැනවි යන්න නිග්‍රහ කොට භික්ෂු ප්‍රතිපදාව අනුගමනය කරන පුද්ගයෙකු විසින් එවැනි ක්‍රියාවක් සිදු කිරීම අපාය උප්පත්තිය සඳහා හේතු වන බව බුදුන් වහන්සේ දේශනා කරයි. මෙහිදි බුදුන් වහන්සේ ශ්‍රමණභාවයට මෙන්ම නිර්වාණයටද බාධා පමුණු වන සදාචාර විරෝධී ක්‍රියාවක් ලෙස මෛථුනධම්ම හඳුන්වා ඇත.

එසේම සංඝයාගේ හිතසුව පිණිස, සංඝයාගේ පහසුබව පිණිස, දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහය පිණිස, ප්‍රියශීල භික්ෂුන්ගේ ඵාසුවිහරණය පිණිස, මෙලොවදී පැමිණිය හැකි දුක් දුරුකිරීම පිණිස, පරලොවදි පැමිණෙන දුක් නැසීම පිණිස, නොපැහැදුණු අයගේ පැහැදීම පිණිස, පැහැදුණු අයගේ වැඩියක් පැහැදීම පිණිස, සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස සහ විනයානුග්‍රහය පිණිස යන දස හිතවිශේෂ වු කරුණු අරමුණු කරගෙන යම් විනය

නීතියක් පනවන ලද්දේ නම් එය පනවා ඇත. පරම නිෂ්ඨාව වන නිර්වාණාවබෝධය සඳහා යන්නට වඩා මෙලොව හා පරලොව වශයෙන් ඇති වන සදාචාත්මක යහපත වැඩි සැලකිල්ලට ගෙන ඇත. පඤ්ඤත්ති ශීලයාගේ විශේෂ ලක්ෂණයක් වන්නේ ශාසනයේ යහපැවැත්ම ආරක්ෂා කිරීමයි; මන්දයත් නිවන යනු හුදු නීති ආරක්ෂා කරගැනීම තුළින් ලබාගන්නා තත්ත්වයක් නොව තම රුචිය හා අවබෝධය තුළින් ළඟාකරගත යුත්තකි. බුද්ධත්වයෙන් මුල් විසි වස තුළ විනය පැනවීම නොතිබුණත් බොහෝ භික්ෂූහු නිවන් අවබෝධ කරගත්හ. එබැවින් විනය නීති පැනවීම බෞද්ධ පරමනිෂ්ඨාවම ඉලක්කකොට සිදු කරණ ලද්දක් නොවේ. එහෙත් එය නිවන්මග අනුගමනය කරන පුද්ගයාට පහසුවෙන් ඒ සඳහා යොමු වීමට මග පාදාදෙයි.

මෛථුනධම්ම පාරාජික ආපත්තියේ ප්‍රථම පැනවීමේ ඇති හිදැස්වලින් ලිස්සා ගොස් ඇතැම් භික්ෂූන් වහන්සේලා එය කඩකළ බැවින් බුදුන් වහන්සේ විසින් එය නැවත දෙවරක් සංශෝධනය කළහ. ප්‍රථම අවස්ථාවේ සුදින්න හිමියන්ද දෙවන අවස්ථාවේ වැදිරියක හා මෛථුන සේවන කළ භික්ෂුවද තෙවන අවස්ථාවේ වජ්ජිපුත්තක භික්ෂූන් යන පිරිස් අරබයා විනය පැනවීම් සිදුකොට ඇත. මෙම ප්‍රධාන පැනවීමට අමතරව අනුපඤ්ඤත්ති රාශියක් ද ඇත. මෙථුධම්ම පාරාජික ආපත්තිය පහත පරිදි වේ.

''යම්කිසි මහණෙක් භික්ෂූන්ගේ අධිශීල සංඛ්‍යාත ශික්ෂාවට හා ප්‍රඥප්ත ශික්ෂාපද සංඛ්‍යාත සාජීවයට පැමිණියේ, ප්‍රාතිමොක්ඛ සංවර සංඛ්‍යාත ශික්ෂාව ප්‍රතික්ෂේප නොකොට, සාජීවයෙහි දුබ ලබව පළනොකොට යටත් පිරිසෙයින් තිරිසන් ගිය මාගමක හා ද මෙවුන්දම් සෙව්යේ නම් කෙලෙස් සතුරන් විසින් පරදවන ලද්දේ පියෙවි මහණුන් හා සමාන සංවාස නැති බැවින් අසංවාස වේ (පාරාජිකපාළි, 2005:57).''

මෙම ශික්ෂාපදයෙහි අර්ථය වඩාත් පැහැදිලි කරගැනීම සඳහා මෙහි පද විග්‍රහය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ශික්ෂාව ප්‍රතික්ෂේප නොකොට (සික්ඛං අපච්චක්ඛාය) සහ දුබල

බව පළනොකොට (දුබ්බල්‍යං අනාවිකත්‍වා) යන පදද්වයෙහි දුබල බව පළනොකොට යන වාක්‍යයේ කිසි විශේෂාර්ථයක් නොමැති බව සමන්තපාසාදිකාව පෙන්වා දෙයි; යම්හෙයකින් දුබල බව පැවසූ කල්හි ද ශික්‍ෂාව ප්‍රතික්‍ෂේප නොකරන ලද්දේ වේ. එහෙත් ශික්‍ෂාව ප්‍රතික්‍ෂේප කළ කල්හි දුබලබව ප්‍රකාශකරන ලද්දේම වේ වේ. එබැවින් 'දුබ්බල්‍යං අනාවිකත්‍වා' යන වැකියේ විශේෂාර්ථයක් නොමැත. ව්‍යාවහාරසුඛය පිණිස, ව්‍යංජන ශ්ලිෂ්ටතාව පිණිස මුඛාරූඪභාවය පිණිස එම වැකිය යොදාගෙන ඇත (සමන්තපාසාදිකා, 1999: 235). ශික්‍ෂාව ප්‍රතික්‍ෂේප වන අයුරු විසිදෙකක් පාරාජිකපාළියේ දක්වා ඇත. එනම්,

1. බුද්ධං පච්චක්ඛාමි (බුදුන් වහන්සේ ප්‍රතික්‍ෂේප කරමි)
2. ධම්මං පච්චක්ඛාමි
3. සංඝං පච්චක්ඛාමි
4. සික්ඛං පච්චක්ඛාමි
5. විනයං පච්චක්ඛාමි
6. පාතිමොක්ඛං පච්චක්ඛාමි
7. උද්දේසං පච්චක්ඛාමි
8. උපජ්ඣායං පච්චක්ඛාමි
9. ආචරියං පච්චක්ඛාමි
10. සද්ධිවිහාරිකං පච්චක්ඛාමි
11. අන්තෙවාසිකං පච්චක්ඛාමි
12. සමානුපජ්ඣායකං පච්චක්ඛාමි
13. සමානාචරියකං පච්චක්ඛාමි

14. සබ්‍රහ්මචාරිං පච්චක්ඛාමි යන 14 ආකාරයෙන්ද

15. ගිහීති මං ධාරෙහි

16. උපාසකොති මං ධාරෙහි

17. ආරාමිකොති මං ධාරෙහි

18. සාමණෙරොති මං ධාරෙහි

19. තිත්ථියොති මං ධාරෙහි

20. තිත්ථියසාවකොති මං ධාරෙහි

21. අස්සමණොති මං ධාරෙහි

22. අසක්‍යපුත්තියොති මං ධාරෙහි

යන දෙවිසි ආකාරයෙන් ප්‍රකාශ කළ කල්හි ශික්‍ෂාව ප්‍රතික්‍ෂේප වන්නේය. ඉහත 'පච්චක්ඛාමි' සහ 'ධාරෙහි' යන වර්තමාන ආඛ්‍යාත පදවලට අමතරව 'අලම් මෙ බුද්ධෙන', 'කින්නු මෙ බුද්ධෙන', 'න මමත්ථො බුද්ධෙන' සහ 'සුමුත්තොහං බුද්ධෙන' ආදි කාලයක් සඳහන් නොවන ප්‍රකාශයන් ප්‍රකාශ කිරීමෙන්ද ශික්‍ෂාව ප්‍රතික්‍ෂේප වේ. යන්නූනාහං, පච්චක්ඛාසිං, පච්චක්ඛිස්සං, ධාරෙසි, ධාරෙස්සසි ආදි අතීත හා අනාගත කාල වශයෙන්ද පරිකල්පන වශයෙන්ද කරන ප්‍රකාශයක් තුළින් ශික්‍ෂා ප්‍රතික්‍ෂේප නොවේ. ලියා පෙන්වීමෙන් හෝ හස්තමුද්‍රා ආදිය මගින් සිදුකිරීමෙන් ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යාන නොවේ; එය වචනයෙන්ම ප්‍රකාශ කළ යුතුය. ප්‍රකෘති සිහියෙන් යුක්තව සම්මුඛ වූ ප්‍රකෘති සිහියෙන් සිටින මිනිස් පුද්ගයා ඉදිරියේ කරනු ලබන ශික්‍ෂා ප්‍රතික්‍ෂේප කිරීම ප්‍රතිග්‍රාහකයා ඉවසන්නේ නම් ශික්‍ෂා ප්‍රතික්‍ෂේප වේ. ප්‍රතික්‍ෂේපය අසන්නා විසින් 'මෙතෙමේ සසුනෙහි කලකිරුණේය,' 'ගිහිබව පතන්නේය' ආදී ලෙස දැනගත යුතුය. උම්මත්තක, ඛිත්තචිත්ත, වෙදනට්ට, දෙවතා, තිරච්ඡානගත යන පිරිස් ඉදිරියේ ශික්‍ෂා ප්‍රතික්‍ෂේප කළේ නමුදු ප්‍රතික්‍ෂේප නොවේ.

මේ ආදී ලෙස ශික්ෂා ප්‍රතික්ෂේප වන අයුරු හා නොවන අයුරු පාරාජිකපාළියෙහි දක්වා ඇත. යම්කිසි මහණෙක් තෙමේ ශික්ෂාව ප්‍රතික්ෂේප නොකොට දුබල බව පළනොකොට මෛථුන සේවනය කෙරේද එවැනි භික්ෂුව නැවත පැමිණියේ උපසපන් නොකළ යුතුය. යම් මහණෙක් ශික්ෂාව ප්‍රතික්ෂේප කොට දුබල බව පළකොට මෙවුන්දම සේවනය කෙරේද එවැනි භික්ෂුව නැවත පැමිණියේ උපසපන් කළ යුතුය (පාරාජිකපාළි, 2005: 57).

ශික්ෂාව ප්‍රතික්ෂේප නොකොට (සික්ඛං අපච්චක්ඛාය) සහ දුබල බව පළනොකොට (දුබ්බල්‍යං අනාවිකත්‍වා) යන ප්‍රකාශය මෛථුනධම්ම පාරාජික ආපත්තියේ අන්තර්ගත වන්නේ වජ්ජිපුත්තක භික්ෂූන් කාමභෝගී ජීවිතයක් ගතකරමින් ශික්ෂාව ප්‍රතික්ෂේප නොකොට දුබල බව ප්‍රකාශ නොකොට මෛථුන සේවනයේ යෙදීම නිසාවෙනි. මේ සාසනයෙහි යම් යම් උපද්‍රවයක් ආදීනවයක් අර්බුදයක් උපන්නේද ඒ සියල්ල වජ්ජිපුත්‍රයන් නිසා උපන්නේය යනුවෙන් සමන්තපාසාදිකාව සඳහන් කරයි. මෙම වජ්ජිපුත්තක භික්ෂූන් සමග එකතුව දේවදත්ත තෙම සංඝයා බිඳ වූ බවත් මොවුන්ගෙන් පැවත ආ ඇතැම් පිරිස් බුද්ධ පරිනිර්වාණායෙන් අවුරුදු සියයක් ගිය තැන ශාස්තෘශාසනය ධර්මයෙන් හා විනයෙන් පහවුවක් කොට දැක්වූහ (1999:215-216) යනුවෙන් වජ්ජි භික්ෂූන්ගේ සදාචාර විරෝධී ක්‍රියාවන් පැහැදිලි කරයි. ශික්ෂාව ප්‍රතික්ෂේප නොකොට සහ දුබල බව පළනොකොට යමෙක් මෛථුනධම්ම සේවනය කොට නැවත පැමිණ උපසම්පදාව ඉල්ලා සිටීද, එවැනි පුද්ගලයෙකු උපසම්පදා කිරීම සාසනට අගෞරයක් වේ; සාමණේර භාවයේ සිටීම ගෞරව සහිත වන්නේය. එමෙන්ම ශික්ෂාවත් ප්‍රතික්ෂේප කොට දුබලබවත් ප්‍රකාශකොට මෛථුන සේවනයේ යෙදී නැවත පැමිණ උපසම්පදාව ඉල්ලා සිටී නම් භික්ෂූභාවයේ සිට විපතට නොපත් සිල් ඇති බැවින් සාසනයේ ගෞරව සහිත වන්නේය, එසේම හේතු සම්පත් ඇති කල්හි නොබෝ කලකින් නිවනට පැමිණෙන්නේ යැයි සිතා ඔහුට උපසම්පදාව ලබාදිය යුතු බව සමන්තපාසාදිකාව දක්වයි (එම,217). මේ අනුව පැහැදිලි වන්නේ යථොක්ත විනය පාඨයෙන් සාසනයේ ගෞරවයට හේතුවන සදාචාරාත්මක බව

සහ පරමනිෂ්ඨාවට උපයෝගී වන කාරණා සැලකිල්ලට ගෙන ඇති බවයි.

ප්‍රතිසේවනය කරයි (පතිසේවති) යනු යම් භික්‍ෂුවක් ස්ත්‍රියගේ නිමිත්ත හා තමාගේ නිමිත්ත ස්ත්‍රියගේ අංජාතය හා තමාගේ අංගජාතය සබ්බන්තිම වශයෙන් තල ඇටයක් පමණකුදු වාතයෙන් නොපහස්නා ලද තෙත් වූ අවකාශයේ ප්‍රවේශ කෙරේද මෙය පතිසේවෙති යනුවෙන් හැඳින්වේ (එම:246). සමන්තපාසාදිකාවේ ස්ත්‍රී නිමිත්තෙහි සතර පැත්ත හා යටිතල පැත්ත යනුවෙන් කොටස් පහක් ද පුරුෂ නිමිත්තෙහි සතර පැත්ත, අගකෙළවර හා මැද පදෙස යනුවෙන් කොටස් හයක්ද දක්වා ඇත. ස්ත්‍රියගේ නිමිත්තෙහි යටට භික්‍ෂුවගේ නිමිත්ත ප්‍රවේශ කිරීමෙන්ද, උඩ පදෙසින් ප්‍රවේශ කිරීමෙන්ද, දෙපසින් ප්‍රවේශ කිරීමෙන්ද, සතර පැත්ත හැර ඇතුල් තලය ගටිමින් මැදින් ප්‍රවේශ කිරීමෙන්ද, පුරුෂ නිමිත්ත යට කොටසින් පහසමින් (ස්පර්ශ) ප්‍රවේශ කිරීමෙන්ද, උඩ කොටසින් පහසමින් ප්‍රවේශ කිරීමෙන්ද, දෙපසින් පහසමින් ප්‍රවේශ කිරීමෙන්ද, මැදින් පහසමින් ප්‍රවේශ කිරීමෙන්ද, පුරුෂ නිමිත්ත මැදින් නවා නැවු නිමිත්තෙහි උඩ කොටසෙහි කෙළවරින් පහසමින් ප්‍රවේශ කිරීමෙන්ද යන මේ ආකාරවලින් සිදු කිරීමෙන් පාරාජික වේ. තවද තමාගේ නිමිත්තෙහි හටගත් සම්කඩක් හෝ පිළිකාගඩක් ස්ත්‍රී නිමිත්තෙහි ප්‍රවේශ කිරිමෙන් පාරාජික වේ. මළසමක් හෝ වියලුණු පිළිකාග ඩක් ඇතුළත් කිරීමෙන්ද, මෛථුන ආශ්වාදයෙන් ඇඟිල්ලක්, මහපට ඇඟිල්ලක් හෝ බීජාදි ඇතුළත් කෙරේද දුක්කටාපත්තියක් වේ. තවද සමන්තපාසාදිකාව සඳහන් කරන්නේ යථොක්ත කරුණු අසභ්‍ය කතා වන බැවින් පිළිකුල්භාවය මෙනෙහි කරමින් හිරි ඔතප් ඇතිව ශ්‍රමණ සංඥාවෙන් බුදුරජුන්ට ගෞරව කොට උන්වහන්සේගේ කරුණාව මෙනෙහි කොට සත්ත්වයන්ට කරුණාවෙන් ශික්‍ෂාපද පැණවීම පිණිස මෙවන් දේශනාවක් සිදු කොට ඇතිබව වටහාගතයුතු බවයි. එසේම මෙවන් දේශනාවක් නොමැති වුවේ නම් මෙසේ පාරාජික වේ මෙසේ තුලැසි වේ මෙසේ දුකුලා වේ යනුවෙන් කෙසේ දැනගන්නේද. මේ කාරණා සැලකිල්ලට ගෙන සිනානොමසි කියන්නා විසින්ද අසන්නා විසින්ද හිරිඔතප් ඇතිව වටහා ගතයුතුය (එම:247).

යටත් පිරිසෙයින් තිරිසන් ගිය මාගමක හා ද (අන්තමසො තිරච්ඡානගතායපි) මෛථුන්දම් සේවනය කිරීම පාරාජිකයකි, එබැවින් මිනිස් ස්ත්‍රිය සමග මෛථුන්දම සේවනය කිරීම කියනුම කිම යනුවෙන් පාරාජිකපාළිය දක්වයි. පාරාජික ආපත්තියට වස්තු වන තිරස්චීනස්ත්‍රිහු සමන්ත පාසාදිකාවේ සඳහන් කරයි.

''පා නැති සතුන් අතර සර්ප-මත්‍ස්‍ය ස්ත්‍රිහුය, දෙපා ඇති සතුන් අතර කිකිළිය, සිවුපාවුන් අතර බැළලිය යන මේ තිරස්චීනස්ත්‍රිහු පාරාජිකයට වස්තුන්ය (1999:247-248).''8

අහි යන අර්ථයෙන් පිඹුරු, තෙලිසප් ආදී දීර්ඝ ජාතීන් ද, මච්ඡ යන අර්ථයෙන් සියලු මත්‍ස්‍ය, කැසුබු, මැඩි ආදී ජාතීන්ද, කුක්කුටි යන්නෙන් කවුඩු, පරෙවි ආදි පක්ෂීන්ද, මජ්ජාරි යන්නෙන් රැක්බලු, මුගටි, ගොයි ආදී සිවුපාවුන් ද ගැනේ. මෙම තිරස්චීනස්ත්‍රිහුගේ වසමග, මුවමග සහ පසමග යන තුන් මගින් එක් මගක මහණහුගේ අංගජාතය තලඇට පමණකුදු ප්‍රවේශ කිරීමට හැකි නම් පාරාජික ආපත්ති වේ. එසේ නොහැකි තිරස්චීනස්ත්‍රිහු දුකුලා ඇවැත් වේ.

සමන්තපාසාදිකාව සඳහන් කරන පරිදි ඇත්, අස්, ගොන්, කොටලු, මීගොන් ආදී තිරිසන් සත්ත්වයන්ගේ නාසයෙහි උපක්‍රම කරන මහණහට ථුල්ලැසි ඇවැත් වේ. සියලු තිරිසන් සතුන්ගේ ඇස් සහ කන්වල සිදුකරන මහණහට දුක්කටාපත්ති වේ (1999:254).

තිරච්ඡානගතායපි යනුවෙන් පාරාජිකපාළියේ දක්වා තිබුණත් එම තිරස්චීනස්ත්‍රිහු කවුරුන්ද යන්නත් එහි සීමාවන් පිළිබඳවත් දක්වා නොමැත එබැවින් එම සීමාවන් හා තිරස්චීනස්ත්‍රිහු පිළිබඳ වර්ගිකරණයක් ඉදිරිපත් කිරීමට අට්ඨකතාචාර්යන් උත්සාහගෙන ඇත. මෙය බුදුන්වහන්සේ විසින් පනව ලද මුල් පැණවීමට සම්බන්‍ධ නොවුනත් යම් භික්‍ෂුවකට මෛථුනධම්ම පාරාජිකාවේ සීමාවන් තේරුම් ගැනීමට ඉවහල් වේ.

පාරාජික ආපත්තිය සිදුවන ආකාරය පැහැදිලි කරන පාරාජිකපාළිය ස්ත්‍රීන්ගේ මාර්ග 18 ක් සහ පුරුෂයන්ගේ මාර්ග 12 ක් යනුවෙන් සියල්ල 30ක් දක්වයි.

1. මනුෂ්‍ය ස්ත්‍රීන්ගේ වසමග, පසමග සහ මුවමග

2. අමනුෂ්‍ය ස්ත්‍රීන්ගේ වසමග, පසමග සහ මුවමග

3. තිරච්ඡාන ස්ත්‍රීන්ගේ වසමග, පසමග සහ මුවමග

4. මනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනක ස්ත්‍රීන්ගේ වසමග, පසමග සහ මුවමග

5. අමනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනක ස්ත්‍රීන්ගේ වසමග, පසමග සහ මුවමග

6. තිරච්ඡාන උභතොබ්‍යඤ්ජනක ස්ත්‍රීන්ගේ වසමග, පසමග සහ මුවමග

7. මනුෂ්‍ය පණ්ඩකයන්ගේ වසමග සහ මුවමග

8. අමනුෂ්‍ය පණ්ඩකයන්ගේ වසමග සහ මුවමග

9. තිරච්ජානගත පණ්ඩකයන්ගේ වසමග සහ මුවමග

10. මනුෂ්‍ය පුරුෂයන්ගේ වසමග සහ මුවමග

11. අමනුෂ්‍ය පුරුෂයන්ගේ වසමග සහ මුවමග

12. තිරච්ජාන පුරුෂයන්ගේ වසමග සහ මුවමග

ඉහත සඳහන් මාර්ගයන් අතුරෙන් එක් මාර්ගයක සේවනය කිරීමේ සිත පහළ වූ කල්හි භික්ෂුව තම අංගජාතය තල බීජයක් පමණවත් ප්‍රවේශ කෙරේ නම් පාරාජික ඇවැත් වේ.

යම්කිසි අවස්ථාවක වෛරී භික්ෂුවක් (භික්ඛුපච්චත්ථිකා), සතුරු රජෙක්, සතුරු සොරෙක්, සතුරු ධූර්තයෙක් හෝ බිලි පිණිස හදවත උපුටාගන්නා සතුරෙක් යථොක්ත සත්ත්වයන්ගේ මාර්ගවල තවත් භික්ෂුවකගේ අංජාතය බලහත්කාරයෙන් ඇතුළත් කරයිද, එසේම යථෝක්ත සත්ත්වයන්ගෙන් නිදිවරණ, නිදිගත්, මත් වූ, උමතු වූ, මළා වූ එහෙත් ක්ෂය නො වූ හෝ මළා වූ

බොහෝ සෙයින් ක්‍ෂය නොවූ අයෙක් රැගෙන විත් ඉහත සඳහන් සත්ත්වයන්ගේ ඒ ඒ මාර්ගවල බලහත්කාරයෙන් තවත් භික්‍ෂුවකගේ අංජාතය ප්‍රවේශ කෙරේද, එම අවස්ථාවේ එයට මුහුණදෙන භික්‍ෂුව එම ප්‍රවේශය (පවෙසනං), ඇතුළට පැමිණීම (පවිට්ඨං), ඇතුළෙහි පැවතීම (ඨිතං) සහ උඩට ගැනීම (උද්ධරණං) යන අවස්ථාවලින් එක් අවස්ථාවකදි සිතින් ඉවසුව හොත් පරිජි ඇවැත් වේ. එසේ නොඉවසයි නම් පරිජි ඇවැත් නොවේ. එමෙන්ම මළාවූ බොහෝ සෙයින් ක්‍ෂය වූ අයෙක් යොදාගෙන ඉහත පරිදි සිදු කිරීමෙදී ඉවසයිද ථුලැසි ඇවැත් වේ, නොඉවසයි නම් ඇවැත් නොවේ. යමකින් වසන ලද (වර්තමානයේ නම් උපත්පාලන කොපු යනුවෙන් භාවිත කළ හැක) යථොක්ත මාර්ගයන් (උදා: ස්ත්‍රී වසමග) භික්‍ෂුවකගේ නොවැසු අංගජාතය ඇතිවදැ, නොවැසු මාර්ගයක වසන ලද භික්‍ෂුවගේ අංගජාතය ඇතිවැද, දෙදෙනාගෙම වසන ලද අංගජාත ඇතිවදැ ඉහත පරිදි ප්‍රවේශ කිරීමෙන් පාරාජික වේ, නොඉවසයි නම් ඇවැත් නොවේ. නොදත් අයට, නොඉවසන්නාට, උමතු වුවහට, වේදනාවෙන් පීඩිත වුවහට, අදිකම්මිකයාට ඇවැත් නොවේ.

යමෙක් තවක් අයෙක් බලහත්කාරයෙන් ලිංගික කාර්යයෙහි යොදවන අවස්ථාවකිදී දුබල පුද්ගයා ඉතා අසරණ තත්ත්වයට පත්වේ. එවැනි අවස්ථාවකදී ඒ කාර්යය සඳහා අනුගතවීම බොහෝ පෘථජ්ජන සත්ත්වයන්ගේ ස්වභාවයයි. එසේම ලැජ්ජාව බිය වැනි මානසික තත්ත්වන් නිසා ඇතැම් විට ඒ අවස්ථාවලදි මෛථුන චිත්තයක් නොපැමිණේ. කෙසේ වෙතත් බලහත්කාරකම සිදුවන්නේ භික්‍ෂුව මෛථුන සේවන සඳහා කිසිසේත්ම නොසිතූ මොහොතකය. එබැවින් එවැනි බලහත්කාරකමකදී ලිංගික ආශාව ඇතිවීම කාගේ වරදක්ද? එසේම එම බලහත්කාරකමට මුහුණදෙන භික්‍ෂුවට එම වරද පැටවිය හැකිද? මෙහිදි දැක්විය හැකි පිළිතුර වන්නේ බලහත්කාරකම භෞතික වශයෙන් සිදුවුත් ලිංගික අවශ්‍යතාව දැනීම ඇතිවන්නේ මානසිකත්වය මත බවයි. එබැවින් එම මානසින කාර්යය පිළිබඳ සිතා එවැනි අවස්ථාවකදී මෛථුන චිත්තයෙන් ඉවසීම පාරාජික වේ. සමන්තපාසාදිකාව සඳහන් කරන පරිදි එවැනි පැනවීමක් අන්තර්ගත වන්නේ සැදැහැයෙන්

පැවිදිව සාසනයෙහි යම් කුලපුත්‍රයෙක් මොනවාට පිළිපදීද එවැනි අය යමෙක් විසින් උපක්‍රමයෙන් මෛථුන සේවනයේ යෙදුවත් එය නොඉවසාද එවැනි භික්ෂූන් ආරක්ෂා කිරීම පිණිස යන්නයි (1999:251).

සමන්තපාසාදිකාව දක්වන පරිදි මෛථුනරාගයෙන් යුක්තව පුරුෂයාගේ වස්තිකෝෂයේ ඇතළත් නොකරමින් නිමිත්තෙන් නිමිත්ත ගැටීම, ස්පර්ශ කිරීම දුක්කටාපත්ති වේ. තවද ස්ත්‍රියගේ නිමිත්ත තුළට ඇතුලත් නොකරමින් නිමිත්තෙන් නිමිත්ත ගැටීම, ස්පර්ශ කිරීම හෝ මුවෙන් ස්පර්ශ කිරීම ථුල්ලැසි වේ (1999:255). එමෙන්ම නොනට කායප්‍රසාදය ඇති නිමිත්තකින් නැසුණු කායප්‍රසාදය ඇති නමිත්ත ගැටීම, නැසුණු නිමිත්තකින් නොනට නිමිත්ත ගැටීම, නැසණු නිමිත්තෙන් නැසුණු නිමිත්ත ගැටීම, නොනට නිමිත්තෙන් නොනට නිමිත්ත ගැටීම සිදුකිරීමේදී තලබීජයන් තරම් ඇතළත් වේ නම් පාරාජික වේ (එම:256). තවද ස්ත්‍රී නිමිත්තෙහි උණබට පුරුක් ආදියක් ඇතුල්කොට එහි යට කොටස ස්පර්ශ කරමින් තලඇට ප්‍රමාණයක් ඇතුලත් කෙරේද, මතු කොටස හෝ දෙපසින් එක් පසක් ස්පර්ශ කරමින් ඇතුල් කෙරේද, සතර පැත්තම ස්පර්ශ නොකරමින් ඇතුල්කොට ඒ උණපුරුකෙහි ඇතුල ස්පර්ශ කෙරේද පාරාජික වේ. එසේ නොමැතිව අහස්ගතම කොට ඇතුල් කොට පිටතට ඇදගනීද, ස්ත්‍රී නිමිත්ත තුළට යැවූ කණුවේ පිටත ස්පර්ශ කෙරේද දුක්කටාපත්තිවේ. මේ ක්‍රමය අනෙකුත් මාර්ගවලටද පොදුය (එම:257).

විනීතවත්ථු කොටසේ විවිධ අවස්ථාවන්වල භික්ෂූන් විසින් සිදුකරන ලද මෛථුනධම්ම පාරාජිකයට සම්බන්ධ ක්‍රියාකාරකම්වලට බුදුන්වහන්සේ විසින් සිදුකළ පැනවීම් අන්තර්ගත වේ. මේ කොටසේ එවැනි වස්තූන් 79 අන්තර්ගත වේ. මෙහිදී ඒ වස්තූන් අතරින් කීපයක් මෛථුනධම්ම පාරාජිකය වඩාත් පැහැදිලිව දැක්වීම සඳහා විමර්ශනය කෙරේ.

ඇවැත් නොවේ යැයි සිතා යම්කිසි උපසපන් භික්ෂුවක් ගිහි වෙසින්, සිවුරු ගලවා නග්නව හෝ විවිධ තණ ආදී දේවලින් සකසා ගත් ඇඳුම් දරා මෛථුන සේවනයේ යෙදේ නම් පාරාජික

වේ. ස්ත්‍රී ලිංගයේ ඇඟිල්ලක් ඇතුල් කිරීම සංඝාදිසේස වේ. එසේම තමාගේ අංගජාතය මුඛයේ හෝ වසමග ඇතල් කිරීම පාරාජික වේ. සිතුවමක හෝ දැවමුවා රුවක මෛථුන රාගයෙන් උපක්‍රම කරන්නහුට දුකුලා ඇවැත් වේ. මේ ආදී වූ විවිධ සිද්ධීන්ට අදාළව පනවන ලද විනය නීති විනීතවත්ථු කොටසේ අන්තර්ගත වේ.

මෛථුනධම්ම පාරාජික ආපත්තියේ සමස්ත පැනවීම් සහ විග්‍රහ දෙස විමසිල්ලෙන් පරීක්‍ෂාකිරීමේදී පැහැදිලි වන්නේ එහි ප්‍රධාන විනය නීතිය වඩාත් තහවුරු කිරීම සඳහා සංකීර්ණ ලෙස එය විශ්ලේෂණය කොට ඇති බවකි. වැඩිදුර පැහැදිලි කිරීම ඇතැම් විට මෙම කරුණු බුද්ධ භාෂිතයක් දැයි සැකකිරීමට පවා ඉවහල් වී තිබේ. ඇතැම් පැනවීම් විකෘති මෛථුන ආශාව ඇති පුද්ගයෙකු විසින් විනා සාමාන්‍ය පුද්ගයෙකු විසින් සිදු කරනු ලැබේ යැයි විශ්වාස කළ නොහැක. එසේ වන්නේ නම් එවැනි පැනවීමක් අවශ්‍ය නොවේ මන්දයත් උන්මත්තකයන්ට ආපත්ති නොවන බැවිනි. ඉහත සඳහන් කරන ලද කරුණුවල අටුවාචාරීන්ගේ අදහස් පසුකාලීනව සිදුකොට ඇති විස්තර බව පැහැදිලිය. එහෙත් පාරාජිකපාළිය බුද්ධභාෂිතයක් නොවේ යැයි කිව හැකිද? මෙහිදී අයි.බී. හොනර් මෙනෙවිය දක්වා ඇති අදහස් විමසා බැලීම වැදගත් වේ. එතුමියගේ දළ අදහස මෙසේය,

''පාරාජික අංක 1 හි සඳහන් නොයෙක් සහ අරුම පුදුම අබ්‍රහ්මචරියාව පිළිබඳ පැහැදිලි කිරීම් කවදා හෝ භික්‍ෂුවක් විසින් සිදුකරන ලද ඒවා යැයි විශ්වාස කිරීම අවශ්‍ය නොවේ. එවැනි අන්තර්ගතයක් මුල් පඤ්ඤත්ති තහවුරු කිරීමට හෝ පැහැදිලි කිරීමට ද අවශ්‍ය නොවේ. සමහර සිදුවීම් සිදුවන්නට ඇත, සමහර සිදුවීම් සිදුනොවන්නට ඇත, නමුත් අපි නොදන්නෙමු. කෙසේ වෙතත් අවසාන සංශෝධනයේදී එක් එක් නීතිය සූක්‍ෂම ලෙස සමීක්‍ෂණය කරමින් හා විශ්ලේශණය කරමින් සංශෝධිතකරුවන් විසින් ඔවුන් අසා ඇති දේ හෝ සිතෙහි මවාගත් කරුණු යම්කිසි පිළිවෙළකට ඇතුළත් කොට ඇත. එවිට අනාගතයේදී එවැනි වැරදි සිදුවන්නේ නොවේ, එමෙන්ම සිදුවුවහොත් ඒ සඳහා

දඬුවම් මොනවාද යන්න (සංශෝධිතකරුවන් විසින්) දක්වා ඇත. අනෙකුත් පාරාජිකා හා සංඝාදිසේස ආදියේ ශ්ලිෂ්ට හා සවිස්තර මෙහෙය වීමද මෙවැනිම වේ. සංශෝධිතකරුවන්ට වගකීම් සහගත කර්තව්‍යක් විය. එනම් අනාගතයට නිතී සම්පාදනය කිරීමයි, එබැන් ඔවුන් එක් එක් ප්‍රධාන නීතිය සූක්‍ෂම ලෙස අර්ථකථන කොට ඇත.

බැලූ බැල්මට හෝනර් මෙනෙවියගේ ප්‍රකාශය සත්‍ය යැයි යමෙකුට සිතීමට ඉවහල් වන්නේ ඉහතින් සඳහන් කළ පරිදි විකෘති මෛථුන සේවනය පවා එහි අන්තර්ගත වීමයි. අනෙක් අතට විනය පිටකය සම්පූර්ණ බුද්ධභාෂිතයක් නොවේ යන්න සත්‍ය කරුණකි. මන්දයක්, බුද්ධ පරිනිර්වාණයෙන් පසුව සිදු කරන ලද පළමු සහ දෙවන ධර්ම සංගායනාවන් පිළිබඳව පංචසතිකක්ඛන්ධකයේ හා සත්තසතිකක්ඛන්ධකයේ අන්තරගත වේ. තවද පදභාජනීය කොටස් ද පසුකාලීන විවරණකරුවන් විසින් සපයන ලද ඒවා බව බැලූ බැල්මට පැහැදිලි වේ. තවද බුද්ධභාෂිත නොවූ ශ්‍රාවක භාෂිත බොහෝමයක් මෙහි අන්තර්ග වේ. උදාහරණයක් ලෙස ප්‍රථම පාරාජිකයේ 52වන විනීතවත්‍ථුවේ සඳහන් පරිදි එක්තරා භික්‍ෂුවක් තම පුරාණ දූතිකාව සමග සිහිනෙන් මෛථුන සේවනය කරයි. එහිදී සිහිනෙන් මෛථුන සේවනය කිරීම ආපත්තියක් නොවන බව ප්‍රකාශ කරන්නේ උපාලි ස්ථවිරයන් වහන්සේ විසින්ය (2005:90). මෙවැනි කාරණා පිළිබඳ සැලකිල්ලට ගැනීමේදී හෝනර් මෙනෙවියගේ අදහස සමග යම්තාක් දුරට එකඟ විය හැක. එහෙත් නිවැරදි එකඟතාවකට පැමිණීමට නම් විනය පිටකයේ සංස්කරණයන්ගේ කාලනිර්ණය පිළිබඳ මෙන්ම බුද්ධභාෂිත මොනවාද යන්න පිළිබඳ පැහැදිලි පර්යේෂණයක් සිදු කළ යුතුය.

කෙසේ වෙතත් මෙවැනි විනය නීති පැනවීම් මගින් අපේක්‍ෂා කොට ඇත්තේ භික්‍ෂුවගේ සදාචාරාත්මක පැවැත්ම ආරක්‍ෂා කිරීමත් එම සදාචාරත්මක හැසිරීම මෙලොව හා පරලොව යහපතටත් අවසානයේ නිර්වාණයටත් උපයෝගී වන අයුරින් පැහැදිලිව දැක්වීමක් බව අවබෝධ කරගත යුතුය.

මෙතැන් සිට ඉතා කෙටියෙන් මෛථුනධම්ම පාරාජික ආපත්තිය හා සම්බන්ධ සදාචාර දර්ශනය හා පරම නිෂ්ඨාව පිළිබඳ තවත් කරුණු කීපයක් සාකච්ඡා කෙරේ. බටහිර ආචාරවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් බැලූ කල පෙනීයන්නේ මෙම විනය නීති හා සම්බන්ධ ආචාරධර්ම යුක්ත්‍යාත්මවාදී (deontology) ස්වරූපයක් උසුලනවාට වඩා සාධ්‍යතාවාදී (Teleology) ලක්ෂණ උසුලන බවකි. භික්ෂුවක් මෛථුන සේවනයෙන් වෙන්ව සිටින්නේ යුතුකමක් (යුක්ත්‍යාත්මවාදී) ලෙස නොව තමාට සාධනය කිරීමට (සාධ්‍යතාවාදී) අරමුණක් ඇති බැවිනි. යුතුකමක් ලෙස භික්ෂුවක් මෛථුන සේවනයෙන් වැළකී සිටීම අවශ්‍ය නොවේ, මන්දයත් එවැනි යුතුකමක් කා වෙනුවෙන් සිදුකල යුතුද යන ප්‍රශ්නය පැනනගින බැවිනි. විවාහක පුද්ගලයෙක් පරදාර සේවනයෙන් වැලකී සිටීම තම බිරිදට සිදු කරන යුතුකමකි. එහෙත් භික්ෂුවට එවැනි යුතුකම් නොමැත. එසේ වුවත් බුදුරජුන්ට ගරුකිරීමක් වශයෙන්, ධර්මයට හා සංඝයාට ගෞරව කිරීමක් වශයෙන් යුතුකමක් ලෙස මෛථුන සේවනයෙන් වැළකී සිටිය හැක. යුතුකමකට වඩා මෛථුන සේවනයෙන් වැළකී සිටීමෙන් භික්ෂුවකට සාධනය කරගතයුතු දෙයක් ඇත. එනම් නිර්වාණය අවබෝධ කරගැනීමයි. මෛථුන සේවනය නිර්වාණයට බාධාවකි, එය යථෝක්ත විනය නීතිවල පැහැදිලිව දක්වා ඇත. නිර්වාණ මාර්ගය අනුගමනය කරන පුද්ගලයා එහි පරම නිෂ්ඨාව කරා ළඟා වීමට නම් අත්‍යවශ්‍යයෙන්ම මෛථුන සේවනයෙන් වැලකී සිටිය යුතුය. නිර්වාණය යන්න අර්ථ දක්වා ඇත්තේ තෘෂ්ණාව නැතිකිරීම රාගය නැති කිරීම නිර්වාණය වේ යනුවෙනි. (තණ්හක්ඛයෝ විරාගෝ නිරෝධෝ නිබ්බානං - ස. නි. I 136 පි. (P.T.S.). තවද රාග, දෝස, මෝහ යන ක්ලේෂයන් ප්‍රමාණ කරණයන් බවත් රහතුන් වහන්සේලා එම කෙලෙස් නැති නිසා මුලසුන් ය. තාලාවස්තුවෙන් කරණ ලදී. මතු නූපදී. යනුවෙන් සැරියුත් රහතන් වහන්සේ මහා කොට්ඨිත තෙරුන් වහන්සේට දේශනා කළහ (ම.නිඃ පිට 286). මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ රාග, දෝස, මෝහ වැනි අකුසල මූල හා සම්බන්ධ මෛථුන සේවනය නිර්වාණාවබොධය සඳහා බාධාවක් බවයි. මෙසේ සැලකීමෙදී යථෝක්ත විනය නීති සාධ්‍යතාවාදි ස්වරූපයක්

උසුලන බව පැහැදිලිව දැක්විය හැක. මෙවැනි සදාචාරාත්මක හැසිරීමක් තුළින් භික්ෂුවක් බලාපොරොත්තු වන්නේ ලෞකික වශයෙන් ලබන පරම නිෂ්ඨාවක් නොව අධ්‍යාත්මික වශයෙන් ලබන පරම නිෂ්ඨාවකි.

## නිගමනය

භික්ෂුවක් විසින් මෛථුන සේවනය කිරීම විනය නීතිවල ඇති බරපතල උල්ලංඝණයක් ලෙස දක්වා තිබීම පුදුම සහගත කාරණයක් නොවේ, මන්දයත් භාරතයේ බොහෝ ශ්‍රමණ සම්ප්‍රදායවල මෛථුන සේවනයෙන් වැළකී සිටීම ශ්‍රමණ ජීවිතයේ පොදු ලක්ෂණයක් විය. නමුත්, මුල් පඤ්ඤත්තිය සූක්ෂ්ම ලෙස විශ්ලේෂණය කරමින් පාරාජිකපාළියේ අන්තර්ගත වී ඇති කරුණු එක් පැත්තකින් ඒවා බුද්ධභාෂිත නොවන බවට යමෙකුට විශ්වාස කිරීමට හේතු වී තිබේ, අනෙක් අතට සර්වකාලීන වශයෙන් එම පඤ්ඤත්තිය භික්ෂුවකට උල්ලංඝනය කිරීමට නොහැකි වීමටද එම කරුණු හේතු වී තිබේ. කෙසේ වෙතත්, නිගමනයක් වශයෙන් එළඹිය හැකි කාරණය වන්නේ මෙම පැනවීම භික්ෂුව හා සාසානසේ සදාචාරාත්මක පැවැත්ම අරමුණුකොට පනවා ඇත යන්නයි, එමෙන්ම එම සදාචාරාත්මක පැවැත්මේ අපේක්ෂාව වන්නේ බුදුදහමේ පරම නිෂ්ඨාව වන නිර්වාණාවබෝධය ලබාගැනීමයි. එසේම මෙවැනි අසීමාන්තික විස්තර සහිත පැනවීම් තුළින් භික්ෂුව කායිකව හා මානසිකව සිරකරතැබීමට පසුකාලීන විනය පිටක සංස්කාරක තෙරවරු විසින් කටයුතු සිදුකොට තිබේ නම් (ඉහත දක්වා ඇති පරිදි) එම නීති සංශෝධනය කිරීම කාලානුරූපව සැලකිය යුතු කාරණයක් බව මෙම පර්යේෂණයෙන් යෝජනා කරනු ලැබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

David, R. & Stede, W. (1921-1925). (eds.). P.T.S Dictionary, London: Luzac and Company LTD.

Childers, R.C. (1976). Dictionary of the Pali Language, Kyoto: Rinsen Book Company.

Buddhadatta Mahathera A.P. (1958) A concise Pali-English Dictionary, Ambalangoda: Aggarama.

Horner, I.B. (1949). (tr.). The Book of the Discipline (Vinaya-Piṭaka) Vol. I (Suttavibhaṅga), London: Pali Text Society.

ධම්මකුසල, අම්බලන්ගොඩ. (1999). (සංස්). සමන්තපාසාදිකා විනයට්ඨකථා, පාරාජිකකාණ්ඩය, (සිංහල පරිවර්තනය), පළමු කොටස, ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය.

වේරගොඩ අමරමොලි ස්ථවිරයන් වහන්සේ. (2005). (පරි.) විනයපිටකයෙහි 01 වන ග්‍රන්ථය, පාරාජිකපාළි, බු.ජ.මු.

කෙසෙල්වතුගොඩ ශ්‍රී රතනජෝති ස්ථවිරයන් වහන්සේ. (2006). (පරි.) විනයපිටකයෙහි 05 වන ග්‍රන්ථය, පරිවාරපාළි, බු.ජ.මු.

Williams, M.M.(1986). (ed.) A Sanskrit English Dictionary; Etymological and Philosophical Arrange with Special Reference to Cognate Indo-European Languages, Dilhi: Motilal Banarsidass.

මලලසේකර, ජී. පී. (2004). (සංස්). ඉංග්‍රිසි-සිංහල ශබ්දකෝෂය, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ජේම්ස් ප්‍රනාන්දු, ඩබ්ලිව්. (1922). (සංස්) සංස්කෘත-සිංහල අකාරාදිය, (The Sanskrit and Sinhalese Dictionary) පානදුර.

Buddhadhatta Mahathera, A.P. (1958) (ed.). Concise Pali- English Dictionary, Ambalangoda.

ම. නි. I මහාවේදල්ල සූත්‍රය 286 පි. (සිංහල - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය)